සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2017 ජනවාරි

## (AA35) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate and Personal Taxation)

2017-01-22
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*

*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

සෑම තක්සේරු වර්ෂයක් (Year of assessment) සඳහාම එම තක්සේරු වර්ෂය සඳහා සෑම තැනැත්තෙකුගේම (Person) ලාභ සහ ආදායම වෙනුවෙන් වන ආදායම් බද්ද:

- එම තක්සේරු වර්ෂය තුළදී ශ්‍රී ලංකාවෙහි වාසිකව සිටි තැනැත්තෙකු සම්බන්ධයෙන් වූ විට, කොතැනක වුවද ඇතිවන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන්; සහ,
- වෙනත් සෑම තැනැත්තෙකු සම්බන්ධයෙන් වූ විට, ශ්‍රී ලංකාව තුළ ඇතිවන හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන ලාභ හෝ ආදායම් සම්බන්ධයෙන්,

උචිත අනුප්‍රමාණ යටතේ, මෙම පනතේ විධිවිධාන වලට යටත්ව අයකරනු ලැබිය යුතු බව දේශීය ආදායම් පනතේ 2 වන වගන්තියේ සඳහන්ව ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත පද **නිර්වචනය කරන්න**:

(a) තැනැත්තා (Person).

(b) තක්සේරු වර්ෂය (Year of assessment). (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත සරසි ෆැෂන්ස් (පෞද්ගලික) සමාගම,** ඇනට ඇඟළුම් නිෂ්පාදනය කිරීමේ නිරත සමාගමක් වන අතර එහි සේවකයෝ 100 ක් පමණ සේවය කරති. සමාගමේ වැටුප් පද්ධතිය සම්බන්ධව කටයුතු කිරීම සඳහා මෑතකදී ඔබව පත්කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

උපයන විට ගෙවීමේ බදු (PAYE) ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී සේවායෝජකයෙකුගේ වගකීම් පහක්(05) **සඳහන් කරන්න.**
(ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සුනිමල්** විශ්‍රාමික ගුරුවරයෙකි. **සුනිමල්ගේ** මිතුරෙකු වන **සරත්** දිනක ඔහු මුණගැසී, තව මාස තුනකින් ඔහු ඕස්ට්‍රේලියාවේ පදිංචියට යන බැවින් ඔහුගේ අක්කර 200 ක රබර් වත්ත රු. මිලියන 40 කට මිලදී ගන්නා ලෙස ඉල්ලා සිටියේය. **සුනිමල්** එය මිලදී ගැනීමට කැමති වුව ද, ඒ සඳහා ප්‍රමාණවත් මුදල් ඔහු සතුව නොතිබුණි. කෙසේවුවත්, ලබාගන්නා ලද මුදලට වත්තෙන් 70% ක් නැවත ඔවුන්ටම පවරාදීමේ එකගතාවයක් මත, මිලදී ගැනීමට බලාපොරොත්තු වන ගැනුම්කරුවන්ගෙන් රු. මිලියන 30 ක් එකතු කර ගැනීමට ඔහු සමත් විය. මාස දෙකක් තුළදී ගනුදෙනුව සම්පූර්ණ කරන බවට එකඟ වෙමින් ඔහු රු. මිලියන 25 ක අත්තිකාරමක් ගෙව්වේය. මාස දෙක අවසානයේදී ඔහු වත්ත මිලදී ගත් අතර ගැනුම්කරුවන්ගෙන් කලින් එකතු කරගත් මුදල් වෙනුවෙන් වත්තෙන් 70% ක ප්‍රමාණයක් ඔවුන්ට පවරා දෙන ලදී. තමා වෙත අක්කර 10 ක් තබා ගනිමින්, සම්පූර්ණ ඉඩම ම මාස 6 ක කාලයක් තුළදී විකුණා ගැනීමට ඔහු සමත්විය. මෙම ගනුදෙනුවෙන් **සුනිමල්** රු. මිලියන 5 ක ශුද්ධ ලාභයක් ලැබුවේය. ඔහු මෙවැනි ආකාරයක ගනුදෙනුවක නිරත වූ ප්‍රථම අවස්ථාව මෙය විය. ඔහු විසින් මෙම ලාභය බද්දට යටත් නොවන ප්‍රාග්ධන ලාභයක් ලෙස සලකා තිබුණි.

කෙසේවෙතත්, මෙම <u>ලාභය වෙළඳාමකින් ලද ආදායමක්</u> ලෙස ඇතුලත් කරමින් තක්සේරුකරු විසින් ඔහු වෙත තක්සේරුවක් නිකුත් කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

තක්සේරුකරු මෙම නිගමනයට එළඹුනේ ඇයි දැයි **සුනිමල්** හට, **පැහැදිලි කරන්න**.

*(මහවිනාරණට එරෙහිව දේශීය ආදායම් කොමසාරිස් නඩු තීන්දුව ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න)*

(ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත අමරස (පෞද්ගලික) සමාගම** දේශීය වෙළෙඳපොළ සඳහා රසකැවිලි නිෂ්පාදනයේ නිරතව සිටියි. 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| | රු. |
|---|---:|
| විකුණුම් [එකතු කළ අගය මත බදු (VAT) රහිතව] | 3,500,000 |
| ඇසුරුම් යන්ත්‍රයක් විකිණීමෙන් ලද මුදල [එකතු කළ අගය මත බදු (VAT) ඇතුලත්ව] | 166,500 |
| දේශීය මිලට ගැනුම් මත ගෙවූ එකතු කළ අගය මත යෙදවුම් බදු (Input VAT) | 260,000 |
| කර්මාන්තශාලාව සඳහා වායු-සමීකරණ යන්ත්‍රයක් මිලට ගැනීමේදී ගෙවූ එකතු කළ අගය මත යෙදවුම් බදු | 85,000 |
| කාර්තුව තුළදී වාරික වශයෙන් පහත එකතු කළ අගය මත බදු ගෙවීම් කර ඇත: | |
| 2016 ජනවාරි 20 | 12,625 |
| 2016 පෙබරවාරි 20 | 15,000 |
| 2016 මාර්තු 20 | 10,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත අමරස (පෞද්ගලික) සමාගම** විසින් 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු ඉතිරි එකතු කළ අගය මත බද්ද (VAT) **තක්සේරු කරන්න**.

*(අදාල වන එකතු කළ අගය මත බදු (VAT) අනුපාතය 11% ක් ලෙස සලකන්න.)* (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# B කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

2014/15 තක්සේරු වර්ෂය සඳහා **සුමනවීර** ආදායම් බදු ගෙවා නැත. ඔහු විසින් ඉදිරිපත් කරන ලද ආදායම් බදු වාර්තාවට අනුව, ගෙවිය යුතු ආදායම් බද්ද වූ රු.1,500,000/- දැන් පැහැර හරින ලද බද්දකි. එම පැහැර හරින ලද බද්ද අයකර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලිඛිත දැන්වීමක් එවා තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පැහැර හරින ලද බදු අයකර ගැනීම සඳහා තිබෙන ක්‍රම තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) දේශීය ආදායම් පනත යටතේ "බලයලත් නියෝජිතයෙකු" (an authorized representative) විය හැකි තැනැත්තන් හතර(04) දෙනෙක් **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත ජුබිලි ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම** ආහාර වර්ග නිෂ්පාදනය කිරීමේ සහ මිලදී ගැනීමේ හා විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටින සමාගමකි. 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා, සමාගමේ පොත් වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) සමාගමේ පිරිවැටුම පහත පරිදි වේ:

| | **රු.** |
|---|---|
| සමාගම විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ | 1,250,000 |
| සමාගම දේශීයව මිලදී ගත් භාණ්ඩ | 3,895,000 |
| | **5,145,000** |

(2) සමාගම පහත පරිදි ජාතිය ගොඩනැගීමේ බදු [Nations Building Tax (NBT)] ගෙවා ඇත:

| | **රු.** |
|---|---|
| ආනයනය කළ අමුද්‍රව්‍ය මත | 11,250 |
| කාර්යාල වියදම් මත | 6,540 |

(3) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) මාසික වාරික වශයෙන් රු.26,000/- ක් ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු ඉතිරි ජාතිය ගොඩනැගීමේ බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 08)

(b) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බදු වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

ගෘහ නිර්මාණ ශිල්පියෙකු වන **සිතුමිණි** සහ ඉංජිනේරුවකු වන **මුතුමිණි,** 2015 අප්‍රේල් 01 දින **සිත්මුතු පාට්නර්ස්** නමින් හවුල් ව්‍යාපාරයක් ඇරඹීය. **සිත්මුතු පාට්නර්ස්** කුඩා ඉඩම් මිලට ගෙන සේවාදායකයන්ගේ අවශ්‍යතා අනුව නිවාස ඉදිකිරීම් කරනු ලබයි. හවුල් ව්‍යාපාරය ඇරඹීමේදී ඔවුහු පහත සඳහන් කොන්දේසි වලට එකඟ වූහ:

- **සිතුමිණි** සහ **මුතුමිණි** පිළිවෙලින් වාර්ෂිකව රු.4,000,000/-ක් සහ රු.2,000,000/- ක් බැගින් වෘත්තිය ගාස්තුවක් ලැබීමට හිමිකම් ලබති.
- වෘත්තිය ගාස්තුවට අමතරව **මුතුමිණි** මසකට රු.50,000/- බැගින් වූ වැටුපකට හිමිකම් ලබයි.

**2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**
**හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශය**

| විස්තරය | | රු. '000 | රු.'000 |
|---|---|---|---|
| පිරිවැටුම | | | 75,000 |
| විකුණුම් පිරිවැය | | | (50,850) |
| **දළ ලාභය** | | | **24,150** |
| වියදම්: | | | |
| වැටුප් | | 7,200 | |
| වෘත්තිය ගාස්තු: | | | |
| **සිතුමිණි** | 4,000 | | |
| **මුතුමිණි** | 2,000 | 6,000 | |
| හවුල්කරුගේ වැටුප් - **මුතුමිණි** | | 600 | |
| කාර්යාල කුලිය | | 480 | |
| විදුලි වියදම් | | 84 | |
| වත්කම් මත ක්ෂය | | 120 | |
| දුරකතන වියදම් | | 60 | 14,544 |
| **ශුද්ධ ලාභය** | | | **9,606** |

තක්සේරු වර්ෂය සඳහා බදු අරමුණ වෙනුවෙන් වූ වත්කම් මත ක්ෂය දීමනාව රු.180,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය **ගණනය කරන්න**. (ලකුණු 05)

(b) හවුල් ව්‍යාපාරයේ ආදායම් බදු බැදියාව **ගණනය කරන්න**. (ලකුණු 02)

(c) හවුල් ව්‍යාපාරයේ ලාභ සහ වෙනත් ආදායම් හවුල්කරුවන් අතර බෙදාහැරීමේ ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# <u>C කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත ගෝල්ඩන් (පෞද්ගලික) සමාගම** සම් පාවහන් නිෂ්පාදනය කර දේශීය වෙළෙඳපොල තුළ විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටියි.

(1) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සාරාංශගත විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පහතින් දැක්වේ:

| | | රු. |
|---|---|---|
| පිරිවැටුම | | 172,450,675 |
| විකුණුම් පිරිවැය | | (102,460,000) |
| **දළ ලාභය** | | **69,990,675** |
| වෙනත් ආදායම් | | 108,000 |
| පරිපාලන වියදම් | 26,437,000 | |
| බෙදාහැරීමේ වියදම් | 7,450,525 | |
| මූල්‍ය වියදම් | 1,506,000 | (35,393,525) |
| **ශුද්ධ ලාභය** | | **34,705,150** |

(2) වෙනත් ආදායම් සමන්විත වන්නේ භාණ්ඩාගාර බිල්පත් වලින් ලද පොලියෙනි.

(3) පරිපාලන වියදම් තුළ පහත ඒවා ඇතුලත් වේ:

| | රු. |
|---|---|
| ක්ෂය කිරීම් | 2,625,000 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | 834,000 |
| දඩ **(1 වන සටහන)** | 276,000 |
| නිති ගාස්තු **(2 වන සටහන)** | 50,000 |
| කුලී **(3 වන සටහන)** | 1,500,000 |
| පරිත්‍යාග **(4 වන සටහන)** | 600,000 |

<u>**1 වන සටහන**</u>

ආදායම් බදු නියමිත වෙලාවට නොගෙවීම නිසා, වර්ෂය තුළදී සමාගමට රු.276,000/- ක දඩයක් ගෙවීමට සිදුවිය.

<u>**2 වන සටහන**</u>

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග (දඩය අඩුකර ගැනීමට) කටයුතු කිරීම සඳහා බදු උපදේශකවරයෙකුට රු.50,000/- ක් ගෙවා ඇත.

<u>**3 වන සටහන**</u>

වර්ෂය පුරාවට සේවයේ නිරතව සිටි රු.200,000/- ක මාසික වැටුපක් ලබන ප්‍රධාන විධායක නිළධාරි (CEO) හට, සමාගම විසින් කුලී රහිත වාසස්ථානයක් ලබා දී ඇත. එම කුලී රහිත නිවස වෙනුවෙන් වාර්ෂික කුලිය වශයෙන් රු.318,000/- ක් සමාගම ගෙවා ඇති අතර එය කුලී වියදම තුළ ඇතුලත් වේ.

<u>**4 වන සටහන**</u>

අවතැන් වූ වැඩිහිටියන්ට ආයතනිකමය රැකවරණය සැපයීම සඳහා පිහිටුවන ලද අනුමත පුණ්‍යායතනයක් වන වැඩිහිටි නිවාසයකට සමාගම රු.600,000/- ක් පරිත්‍යාග කර ඇත.

(4) රු.435,000/- ක සංග්‍රහ වියදම්, බෙදාහැරීමේ වියදම් වල ඇතුලත් වේ.

(5) මූල්‍ය වියදම් වල පහත දෑ ඇතුලත් වේ:

| | රු. |
|---|---|
| කල්බදු පොලී | 270,000 |
| අයිරා පොලී | 524,000 |

(6) වර්ෂය තුලදී පාරිතෝෂික ලෙස ගෙවීම් කිසිවක් සිදුකර නොතිබුණි.

(7) අනෙකුත් සියලු වියදම් සඳහා බදු අරමුණු වෙනුවෙන් ඉඩ ලබා දේ.

(8) වර්ෂය තුලදී අත්පත් කරගත් වත්කම් පිළිබඳ විස්තර පහතින් දැක්වේ:

| වත්කම | පිරිවැය (රු.) |
|---|---|
| ගෘහ භාණ්ඩ **(5 වන සටහන)** | 860,000 |
| යන්ත්‍රෝපකරණ | 7,370,000 |
| පරිගණක | 435,000 |
| මොටර් වාහන **(6 වන සටහන)** | 2,736,000 |
| මෝටර් වාහන - කල්බදු **(7 වන සටහන)** | 1,800,000 |
| | **13,201,000** |

**5 වන සටහන**

ප්‍රධාන විධායක නිළධාරිගේ නිවස සඳහා මිලට ගත් පිරිවැය රු.150,000/- ක් වූ සෝපාවක් ගෘහ භාණ්ඩ වල ඇතුලත් වේ.

**6 වන සටහන**

ව්‍යාපාරික ගමන් බිමන් සඳහා භාවිත කරන රු.2,250,000/- ක් පිරිවැය වූ මෝටර් රථය හැර අනෙක් මෝටර් වාහන විධායක නොවන සේවකයන් විසින් භාවිත කරනු ලබන මෝටර් සයිකල් වලින් සමන්විත වේ.

**7 වන සටහන**

2015 මැයි 01 දින වසර 5 ක මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ බෙදාහැරීමේ වෑන් රථය ලබා ගන්නා ලදි. මාසික කල්බදු වාරිකය රු.44,000/- ක් වන අතර වර්ෂය තුලදී වාරික 10 ක් ගෙවා තිබුණි.

(9) 2015 අප්‍රේල් 01 දිනට පැවති වත්කම් මත බදු අරමුණු සඳහා වන ක්ෂය දීමනා සම්පූර්ණයෙන් ම ලබාගෙන තිබුණි.

(10) පෙර තක්සේරු වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ වැඩිපුර ගෙවූ රු.800,000/- ක ආර්ථික සේවා ගාස්තු [Economic Service Charge (ESC)] සමාගමට ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2015/16 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) මුළු ව්‍යවස්ථාපිත ආදායම,

(b) තක්සේරු කළ හැකි ආදායම,

(c) බදු අයකළ හැකි ආදායම,

(d) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ,

(e) ගෙවිය යුතු ඉතිරි බද්ද.

***සැ.යු:*** *යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.* (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

සුදුසුකම්ලත් ඖෂධවේදියෙකු වන **හෙට්ටිගේ**, වාසික පුද්ගලයෙකු වන අතර ඔහු 2013 වර්ෂයේදී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු **සුවසහන පෞද්ගලික රෝහලේ** සේවයේ නිරතව සිටී. 2015/16 තක්සේරු වර්ෂය (මින්මතු "වර්ෂය" යැයි හැඳින්වෙන) සඳහා **හෙට්ටිගේ** සම්බන්ධ පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) ශ්‍රී ලංකා රජයෙන් ලැබුනු වාර්ෂික විශ්‍රාම වැටුප රු.540,000/- කි.

(2) ඔහුට **සුවසහන පෞද්ගලික රෝහලෙන්** රු.120,000/- ක මාසික වැටුපක් ලැබී ඇත. තවද, 2015 දෙසැම්බර් මාසයේදී එක් මාසයක වැටුප ප්‍රසාද දීමනාවක් ලෙස ඔහුට ගෙවා ඇත.

(3) හඳුනාගත් සන්නාම් නාමයන් යටතේ ඖෂධ ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් වර්ෂය තුලදී රු.135,000/- ක කොමිස් මුදලක් ඔහුට ගෙවා ඇත.

(4) වර්ෂය තුලදී, දෙදින වෛද්‍ය සමුළුවක් සඳහා ඔහු පකිස්ථානයට යවන ලද අතර, නවාතැන් වෙනුවෙන් දිනකට ඇමරිකානු ඩොලර් 250 බැගින් රෝහල විසින් ඔහුට ගෙවා ඇත. ගුවන් ටිකට්පත ද රෝහල විසින් සපයන ලද අතර එහි පිරිවැය රු.75,000/- ක් විය. (ඇමරිකානු ඩොලර් 1 = රු.142/-)

(5) බොහෝ කලකට ඉහත දී ඔහු විසින් මිලට ගත්, නුගේගොඩ පිහිටි නිවසක ඔහු වාසය කරයි. එම නිවසේ ශුද්ධ වාර්ෂික වටිනාකම රු.150,000/- කි.

(6) ඔහුගේ දෙමාපියන්ගෙන් උරුම වූ වෙනත් නිවසක් ඔහුට මාතර නගරයේ ඇති අතර එය රු.60,000/- ක මාසික කුලියකට 2014 අප්‍රේල් 01 දින සිට ප්‍රසිද්ධ අවන්හල් ජාලයකට කුලියට දී ඇත. මෙම නිවසේ වරිපනම් තක්සේරුව රු.180,000/- ක් වන අතර 30% බැගින් වරිපනම් ගෙවා ඇත.

(7) ඔහුට කුරුණෑගල ඉඩමක් තිබේ. වර්තමාන රැකියාව වන **සුවසහන පෞද්ගලික රෝහලෙන්** 2018 දී විශ්‍රාම ගැනීමෙන් පසු, ඔහුගේ වාසස්ථානය කුරුණෑගලට මාරු කිරීමට ඔහු සැලසුම් කරමින් සිටී. වර්ෂය තුලදී, මෙම ඉඩමේ වර්ග අඩි 490 ක නිවසක් ඔහු විසින් ඉදි කරන ලද අතර, මුළු ඉදිකිරීම් පිරිවැය රු.650,000/- ක් විය. මෙම නිවස ඉදි කිරීම සඳහා ඔහු විසින් මහජන බැංකුවෙන් නිවාස ණයක් ලබාගෙන ඇත. මෙම ණය මුදල සඳහා වර්ෂය තුලදී ඔහු විසින් පොලිය සහ ප්‍රාග්ධන ආපසු ගෙවීම වශයෙන් පිළිවෙලින් රු.27,000/- ක් සහ රු.32,000/-ක් ගෙවා තිබුණි. මෙම නිවසේ ශුද්ධ වාර්ෂික වටිනාකම රු.75,000/- කි.

(8) 2006 දී මිලට ගන්නා ලද පිරිවැය රු.1,400,000/- ක් වූ ඔහුගේ පෞද්ගලික මෝටර් රථය ඔහු වර්ෂය තුලදී විකුණන ලදී. රු.1,600,000/- ක් වූ විකිණීමෙන් ලද මුදල නව මෝටර් රථයක් මිලට ගැනීම සඳහා භාවිත කරන ලදී.

(9) මහජන බැංකුවේ රු.1,500,000/- ක ස්ථාවර තැන්පතුවක් **හෙට්ටිගේ** ට තිබෙන අතර වර්ෂය තුලදී රු.105,000/- පොලියක් ඔහුට ලැබී ඇත. මෙම පොලී ආදායම මත බැංකුව විසින් බදු අඩුකර නොතිබුණි.

(10) වර්ෂය තුලදී පහත සඳහන් ලාභාංශ ලැබී ඇත:

| | **රු.** |
|---|---:|
| ලාභාංශ - බද්දෙන් නිදහස් ලාභ වලින් | 36,000 |
| ලාභාංශ - 10% බැගින් රඳවාගැනීමේ බදු අඩු කර ඇති වෙනත් සමාගම් වලින් ලැබුණු ලාභාංශ වලින් | 9,000 |
| | **45,000** |

(11) **හෙට්ටිගේ** වර්ෂ 10 කට ඉහත දී ඔහුගේ බිරිඳගෙන් දික්කසාද විය. අධිකරණ නියෝගය අනුව, ඔහුගේ කලින් බිරිඳට මසකට රු.15,000/- බැගින් ගෙවිය යුතුය. වර්ෂය තුළදී ඔහු රු.180,000/- ක් ගෙවා ඇත.

(12) ජීවිත රක්ෂණ ඔප්පුවක් මත ඔහු විසින් රු.84,000/- ක වාර්ෂික වාරිකයක් ගෙවන ලදී.

(13) වර්ෂය සඳහා අඩු කරන ලද උපයනවිට ගෙවීමේ බද්ද (PAYE) රු.55,600/- කි.

(14) ඔහු විසින් ස්වතක්සේරු පදනම මත රු.10,000/- ක ආදායම් බද්දක් ගෙවා ඇත.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

2015/16 තක්සේරු වර්ෂය සඳහා **හෙට්ටිගේ ගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**.

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි බද්ද, සහ,

(d) බදු නිදහස් ආදායම (වේ නම්).

(ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>අවබෝධය<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | හඳුනා දක්වන්න | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | සඳහන් කරන්න | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම. |
| | විමසන්න | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | පැහැදිලි කරන්න | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | අර්ථකතනය කරන්න | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | හඳුනාගන්න | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | සටහන් කරන්න | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | සාරාංශගත කරන්න | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>භාවිතය<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | ප්‍රදර්ශනය කරන්න | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | පිළියෙල කරන්න | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | ප්‍රමුඛතා දක්වන්න | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | සසඳන්න | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>විශ්ලේෂණය<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | සමානකම් බලන්න | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |